*<u>සියල්ල ඉතා බැරෑරුම් ලෙස වෙනස් වී ඇති බව දිලීප ට දැනෙයි. බිඳුන බඳුනක් නැවත කෑල්ලෙන් කෑල්ල එක් තැන් කරන්නා සේ ජීවිතය නැවත ගොඩ නැගීමට සිදුව ඇති බව පැහැදිලි ය.</u>*

සුවයකි. ඇය පිළිබඳ නොසන්සිඳෙන මහා තෘෂ්ණාව විසින් තමා අතරමං කරනු ලැබ ඇති බවක් ඔහුට දැනෙයි. වෛර කළ යුතු මොහොත් දී එසේ කරන්නට තරම් ශක්තියක් තමා තුළ නැත්තේ ඒ තෘෂ්ණාව නිසා නොවේ ද?

ඇය අයිති තමාට ය. කවර මිලක් ගෙවා හෝ ඒ අයිතිය රැක ගත යුතු ය. ඇය නැති ජීවිතයක් පිළිබඳ ව සිතන්නට හෝ නොහැකි ය.

සිංගප්පූරුවෙන් බසින විට නිෂාඩි බොහෝ සේ වෙහෙසට පත්ව සිටියා ය.

''ඔයාට අමාරු ද..?'' ඔහු ඇසුවේ ඒ බව දුටු නිසා ය. ඇය පිළිතුරක් නොදුන්නා ය. ඔහු නැවත කිසිවක් ඇගෙන් අසන්නට නොගියේ ය.

සියල්ල ඉතා බැරෑරුම් ලෙස වෙනස් වී ඇති බව දිලීප ට දැනෙයි. බිඳුන බඳුනක් නැවත කෑල්ලෙන් කෑල්ල එක් තැන් කරන්නා සේ ජීවිතය නැවත ගොඩ නැගීමට සිදුව ඇති බව පැහැදිලි ය. තමා ඒ කාරියට කොයි තරම් සමත් දැයි විශ්වාසයක් ඔහුට නොවී ය.

00000000000

අනුරාධ මුලු සතියම ගත කළේ කාමරයට වී කල්පනා කරමින් ය. සුනෙත් වරින් වර පැමිණ ගිය නමුත් ඔහු සමඟ හෝ කාමරයෙන් පිටත යන්නට සිතක් අනුරාධට නොවී ය.

නිෂාඩි ලංකාවෙන් ගොස් දින දෙකකට පසු අනුරාධ ඇයට දුරකතන ඇමතුමක් දෙන්නට පළමු වරට උත්සාහ කළේ ය. දුරකතනය නාද වුණා පමණි. පිළිතුරු දෙන්නට කිසිවකු නැතැයි ඔහු අනුමාන කළේ ය. දෙවන දිනයේ අනුරාධ දුරකතන ඇමතුම දෙන විට ඔහුට ඇසුණේ දුරතකනය විසන්ධි කර ඇති බව කියැවෙන නිවේදනය පමණකි.

**සත් සමුදුරින් දුර ඈතක නුඹ සැඟ වී**<br>**සෙනෙහස හඬයි අප හදවත් තුළ සිර වී**<br>**තුන්තිස් පැයම නෙතු කඳුළින් යයි දිය වී**<br>**සිත ඉති බිඳියි නුඹගේ උණුසුම සිහි වී**

''උගත් කම තිබ්බට මෝඩයෙක්.. '' එදින සවස දුරකතනයෙන් කතා කළ පවිත්‍රා කීවා ය. වචන ලෙස මේ පිටවන්නේ දිලීප කෙරෙහි ඇතිවූ අප්‍රසාදය ම නොවේ ද..? ''.. එක්ටැම් ගෙයි දාලා හිරකරන්න වගේ කල්පනාව..''

''අනුරාධ හිත කලබල කරගන්න එපා.. නිෂාඩි කොහොම හරි කතා කරයි..'' පවිත්‍රා නැවත කීවේ අනුරාධ කිසිවක් නොකී බැවිනි.

''මට වැඩක් කරන්න හිතක් නෑ..'' ඔහු කීවේ ය. ''..හෙට ෆිල්ම් එකක ඩබිං තියෙනවා.. මට යන්න හිතක් නෑ.. කැන්සල් කළා..''

පවිත්‍රා සිනාසෙනු දුරකතනය තුළින් ඇසුණි.

''ලංකාවෙ සිනමා ඉතිහාසයත් වෙනස් වෙන්නයි යන්නෙ මේ ප්‍රේම වෘත්තාන්තය නිසා.. ජනකාන්ත නලුවා ප්‍රේමය වෙනුවෙන් රංගනය අතහරියි කියලා කියන්න වෙයිද දන්නෙ නැහැ.. අනේ එහෙම නම් කරන්න එපා.. රටේ කෙල්ලො අඬලා අඬලා සියදිවි නසා ගනියි..''

0000

නිෂාඩිගේ අසනීප තත්ත්වය මත සිය නිවාඩුව තවත් සතියකින් දික්කර ගන්නට දිලීපට හැකි විය. නිෂාඩි වෛද්‍ය පරීක්ෂණ සඳහා ගෙන යන්නට ඔහු දින කීපයක්ම කැප කළේ ය. අනෙක් අතින් මේ තරම් ඉක්මනින් විශ්ව විද්‍යාලයයේ සිය පර්යේෂණ කටයුතු සඳහා යළි කැපවන්නට තරම් සුදුසු මානසික තත්ත්වයක තමා නැති බව ඔහුටම වැටහී තිබුණි.
''මොන ප්‍රශ්න තිබුණත් තීසිස් එක ඉක්මනට ඉවර කරන්න බලන්න..'' සඳලි කීප වතාවක්ම ඔහුට

*මගේය කියලා ආසාවෙන් ළං කර ගෙන ඉන්න හදන්නෙ අපට අයිති දෙයක් නොවෙන්න පුලුවන් දිලීප.. ඒවා අයිති අයටම දෙන්න.. අයිතිය කියන්නෙ ඔයා අදහන නීති පොතේ ලියව්ච්ච අයිතිය නෙවෙයි.. සංසාරගත අයිතිය..*

දුරකතනයෙන් කතා කර කීවා ය.

''කිසිම ප්‍රශ්නයක් නැහැ.. මට පොඩි විවේකයක් ඕනෙ වුණා.. ඒකයි..'' ඇය අවසන් වතාවට එසේ කියද්දී දිලීප කීවේ ය. සඳලි සිනාසෙනු ඔහුට ඇසුණි. ''මට ඉවසන්නම බැරි ඔයාගෙ ඔය අවිච්චාදි හිනාවමයි..'' ඔහු කිවේ කෝපයෙනි.

''හිනා යනවා.. මෙච්චර දෙයක් වෙලත් තාම අභිමානය රැකගන්නමයි සටන.. අනේ මහත්තයා ඔයා ඔය කරන්නෙ පරදින සටනක්... තේරෙන්නෙ නැද්ද ඒක..''

''ඔයාට පිස්සු..''
''අනිත් අයට ඇඟිල්ල දික් කරන්න එපා..''

''ඔයා අනං මං වලින් ඔලුව පුරෝගෙන.. මෙතන ඔයා හිතනවා වගේ කිසිම දෙයක් නැහැ.. මේක පොඩි ඇක්සිඩන්ට් එකක්.. එච්චරයි..''

''පොඩි නං කොච්චර හොඳද.. ඒක වෙන්න ඇති ගෙදර ටෙලිෆෝන් නම්බර් එකත් මාරු කරලා



තියෙන්නෙ.. ඕවා හරි බොළඳ උපක්‍රම මහත්තයා.. පොඩි ළමයි කරන වැඩ''

සඳලිට දෙන්නට පිළිතුරක් ඔහුගේ සිතට නොඑයි. දුරකතන අංකය වෙනස් කළේ ක්ෂණික තීරණයකිනි. ඒ මොහොතේ සිතට ආ වේගයට එසේ කළා විනා එය නිරර්ථක ක්‍රියාවක් බව තේරුම් ගන්නට හෝ ඔහු උත්සාහ නොකළේ ය. නිෂාඩි සිරකාරියක සේ තමා ගේ විජිතය තුළම තබා ගන්නට සිතීම කොයි තරම් අනුවණ ක්‍රියාවක්දැයි ඔහු දනියි.

''ගිලෙන්න යන මිනිහා පිදුරු ගහෙත් එල්ලෙනවනේ ජීවිතේ බේරගන්න.. ඔයත් කළේ ඒ වගේ වැඩක්.. තරහා ගන්න එපා එහෙම කිව්වට.. දන්නවනේ මගේ හැටි.. හිතට එන දේ නොකියා ඉන්න පුරුද්දක් නෑ මට.. තරහකටවත් අපහසුවකටවත් පත් කරන්න නෙවෙයි.. මොළේ පාදන්න..'' දිලීප පිළිතුරක් නොදුන් තැන සඳලි කීවා ය.

''සමහරවිට ඔයා කියන දේ හරි ඇති..'' දිලීප සෑහෙන වේලාවකට පසුව කීවේ ය. ''ඔයත් එක්ක කතා කරලා දිනන්න බෑ.. මං පරාජය බාරගන්නං..''

''එහෙමනං ගෙදර ඉඳන් නෝනා මහත්තයාව පරිස්සම් නොකර මෙහෙට ඇවිත් මේ වැඩ ටික ඉවර කරගන්න.. ඔයාගෙම හොඳටයි මේ කියන්නෙ.. අවුරුදු ගාණක් තිස්සෙ දහදුක් විඳලා එක්ස්පෙරිමන්ට්ස් කරලා බෙල්ල කඩාගෙන රිසර්ච් කරලා අන්තිම කෙළවරට ඇවිත් පිස්සු කරගන්න එපා.. ළං වීම් ඈත් වීම් සදාකාලිකවම නොකඩවා සිදුවෙනවා.. ඒවට සැළෙන්නවත් ඒවා නිසා ජීවිත අවුල් කරගන්නවත් ඕනෙ නැහැ.. මගේය කියලා ආසාවෙන් ළං කර ගෙන ඉන්න හදන්නෙ අපට අයිති දෙයක් නොවෙන්න පුලුවන් දිලීප.. ඒවා අයිති අයටම දෙන්න.. අයිතිය කියන්නෙ ඔයා අදහන නීති පොතේ ලියව්ච්ච අයිතිය නෙවෙයි.. සංසාරගත අයිතිය..''

00000

කෙළවරක් නැති වෛද්‍ය පරීක්ෂණ නිසා නිෂාඩි වෙහෙසට පත්ව සිටියා ය. ලංකාවට දුරකතන ඇමතුමක් දෙන්නට තරම් ශාරීරික හෝ මානසික විවේකයක් ඇයට නොවී ය. ඇය මුලු කාලයම ඇඳට වී ගත කළා ය. දිලීප වරින්වර පැමිණ යමක් අසා ගියේ ය. ඔහු සාදා ඇඳ අසළ තැබූ තේ කෝප්ප කීයක් නිවී ගියා දැයි නිෂාඩිම නොදැන සිටියා ය.

දීර්ඝ ගුවන් ගමන නිසා සිය ශාරීරික වේදනා තවත් වැඩි වූවා සේ නිෂාඩිට දැනෙයි. ඒ බව දිලීපට කියන්නට හෝ ඇය උත්සාහ නොකළා ය. ඔහු පිළිබඳ කණගාටුවක් සිය සිතේ පහළ නොවන්නේ මන්දැයි ඇය තමාගෙන්ම අසා ගත්තා ය. අනුරාධ පිළිබඳ මතකය විසින් පාරන ලද සිත වෙනත් කිසිදු හැඟීමකට ඉඩක් තබා නැති බව ඇය දැන සිටියා ය.

සැඩ ගඟක් සේ ගලා<br>ජීවිතේ පුපුරුවා<br>අකල් වැසි වස්සවා<br>වසන්තය සිනා සේ....<br>දුර ඉඳන්

සතියක් ගතවූ පසුවත් අනුරාධ වෙතින් දුරකතන ඇමතුමක් නොලැබීම ඇගේ සිතේ කණගාටුවක් ඇති කර තිබුණි. ඔහුට තමා අමතක වී ද? කිසිදා එසේ විය නොහැකි ය. අවසන් වතාවට ගුවන් තොටේ දී ඔහු මුමුණා කී දේ කිසිදා වෙනස් නොවන බව ඇයට සහතික ය.

දින කීපයක සිට නිෂාඩිට කෑම අප්‍රිය වී ඇත. වරින් වර ඇතිවන අප්‍රසන්න හැඟීම ඇයට තේරුම් ගත නොහැකි ය. උදෑසන ඇය අපහසුවෙන් නැගිට නාන කාමරයට ගියේ දිලීපට නොදැනෙන ලෙසට ය. නාන කාමරෙයේ දොර වසා ගත් නිෂාඩි සෝදන බේසමෙහි එල්ලී වමනය කළා ය.

''නිෂා මොකද මේ..? දොර අරින්න..'' දොර අසළ සිට දිලීප කෑ ගසනු ඇයට ඇසුණි.

තමා ක්ලාන්ත වන්නට යන බව ඇයට දැනෙයි. ඇය දොර අසළ බිම වාඩි වූවා ය.

0000

''අයි හැව් අ වෙරි ගුඩ් නිව්ස් ෆො යූ දිලීප..'' වෛද්‍යවරයා නිෂාඩිට වාඩි වන්නට උදව් කරන අතර කීවේ ය. දිලීප ඔහු දෙස බැලුවේ ප්‍රශ්නාර්ථයක් රැඳුණ මුහුණින් ය.

සෝදන බේසමෙන් දෑත් සෝදාගත් වෛද්‍යවරයා අත්පිස්නාවකින් දෑත් පිස ගනිමින් සිය පුටුවේ වාඩි විය. ඉන් අනතුරුව මේසය හරහා දිලීප දෙසට සිය දකුණත දිගු කළේ ය.

''මයි කන්ග්‍රැජුලේෂන්ස් දිලීප... යූ ආ ගොයිං ටු බී අ ප්‍රව්ඩ් ඩෑඩ්..''

**ළබන කළාපයට**



## මතක සුවඳ

ඔබ මා නෙත් සමුගෙන වෙන් වී<br>ඈත දුරක ගියා නොපෙනී රහසේ..<br>සිත දැවුණා මා ගත සසළ වී<br>නෙතු කඳුළැල්ලක් මට දී..<br>තාම මතකයි සුවඳ ඔබේ<br>සොඳුරු මිහිරි එදිනේ...<br>අකුරු කරනා තක්සලාවේ පෙර දිනදී<br>නෙතින් නෙත ගැටුණා රහසේ..<br>සසරේ බැඳී ආ විලසේ<br>දිනෙන් දින බැඳුණා පෙමින්<br>කාටත් හොර රහසේ..<br>සිත පිබිදී එල දැරුවා ඒ පෙර දිනයේ<br>නොසිතූ විලසින් සමුගත්තද එදිනේ<br>හද කුසුම් දවා දෙසිතේ..<br>අදටත් ඔබ සුවඳ මසිතේ<br>සදා රැඳී ඈත මහද පතුලේ...

**දමිත් සුරංග දිසානායක**
මහා බ්‍රිතාන්‍යය

## පන්හිඳට ඇරයුමක්

අම්මප්පා කවිරුද - නැහැදෑයො කවිරුද<br>කිසිවකු නොදනනා - නුබේ පැටිකිරිය නම් රහසකි<br>සියවස් ගනනක්ම - බන මතුරු සාහිත පොත්<br>සිය ගනනක් ලියා - විසුම් සුවයෙන් ගෙවන කල් දැන්<br>'විස්කමා' යනුවෙන් - හැඳින්විය යුතු නුඹ ගැන<br>නුඹ ලියූ පොත් ගැන - සිතන මා සිත විඩා පත් වේ<br>සහස් වස් ගනනක් - දැරූ තම තනතුර සුන<br>පිරිනමා පෑනට - ඔබ ගියේ දස සිල් රකින්නද?<br>වැලිහිඳ නම් ගමකි - සන්හිඳ විඩා නිවනකි<br>ඒ නම් දෙක දනිමි - එහෙත් නුඹ ගැන කිසිත් නොදනිමි<br>සකි සඳුනි පන්හිඳ - නුබේ සුල මුල ගැන් පට<br>පැවසුව මැනවි ඇති තතු - රන් පතක සටහන් කොට<br>'පන්හිඳ' යන ගම - හැඳී ඇති හැටි දන්නා<br>යමෙකකු වෙත් නම් - පැවසුව මැනවි සන්නස තුලින්

**විකසිත**